කුච්චවේලි ප්‍රාදේශීය සභාව

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

----------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

--------------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම.

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ 2014 මැයි 13 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ සංශෝධිත මූල්‍ය ප්‍රකාශ 2015 අප්‍රේල් 20 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අප්‍රේල් 30 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

1.2 මතය

-------

මෙම වාර්තාවේ 1:3 ඡේදයෙන් දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට කුච්චවේලි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

පහත සඳහන් ගිනුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විවිධ තැන්පතු ලෙජරය අනුව 2013 දෙසැම්බර් 31 දිනට විවිධ තැන්පතු ගිණුමේ ශේෂය රු.4,221,592 ක් වූ අතර එය රු.4,981,534 ක් ලෙස මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා තිබුණි. මේ නිසා විවිධ තැන්පතු ශේෂය රු.759,942 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) කොන්ත්‍රාත්කරු , තැන්පතු ලෙජරය අනුව 2013 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් තැන්පතු ගිණුම් ශේෂය රු.7,568,037 ක් වූ අතර එය රු.7,851,797 ක් ලෙස මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා තිබුණි. එබැවින් කොන්ත්‍රාත්කරු තැන්පතු ශේෂය මූල්‍ය ප්‍රකාශයන්හි රු.283,760 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) විවිධ ණයහිමි ලෙජරය අනුව 2013 දෙසැම්බර් 31 දිනට ණයහිමි ශේෂය රු.591,135 ක් වූ අතර එය මූල්‍ය ප්‍රකාශයන්හි රු.213,605 ක් ලෙස ගිණුම් ගතකර තිබුණි. මේ හේතුකොට ගෙන මූල්‍ය ප්‍රකාශයන්හි විවිධ ණයහිමි ශේෂය රු. 259,530 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) නැගෙනහිර පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු ට්‍රැක්ටරයක වටිනාකම වූ රු.1,480,000 ගිණුම් ගතකර නොතිබුණි.

(ඉ) අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු 09 කින් සභාවට ලැබී තිබූ මෝටර් වාහන 18 ක් අගය කර ගිණුම් ගතකර නොතිබුණි.

1.3.2 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

-----------------------------------------

(අ) සේවය අතහැර ගිය නිලධාරීන් පස් දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.8,500 ක් වූ කාර්ය මණ්ඩල ණය වර්ෂ 32 ක කාලයක් තිස්සේ අයකරගෙන නොතිබුණු අතර එම මුදල් අයකර ගැනීමට හෝ ලෙජරයෙන් ලියා හැරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ) වෙනත් දෙපාර්තමේන්තු වලට මාරු කරන ලද නිලධාරීන්ගෙන් එකතුව රු.548,729 ක් වූ හිඟ කාර්ය මන්ඩල ණය අයවිය යුතුව තිබුණි. වර්ෂ 03-05 අතර කාල පරිච්ඡේද පරාසයක් තුල මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

--------------------------------------------

පහත සඳහන් ගිණුම් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැති වීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| ඉඩම් සහ ගොඩනැගිලි | 79,151,944 | ඉඩම් අයිතිය පිළිබඳ හිමිකම් ඔප්පු |
| යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 13,690,632 | |
| ලීබඩු | 2,547,653 | ස්ථාවර වත්කම් ලේඛණය සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| මෝටර් වාහන | 15,813,186 | |

1.3.4 අවිනිශ්චිත ගිණුම්

අවිනිශ්චිත ගිණුමෙහි වූ රු.1,523 ක බැර ශේෂයක් හදුණාගෙන නිරවුල් කිරීමට නොකොට 2005 වර්ෂයේ සිට ඉදිරියට එමින් පැවතුණි.

1.3.5 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමණාකරණයන්ට අනුකූල නොවූ පහත සඳහන් අවස්ථා විගනණයේදී නිරික්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පණත | | |
| II පරිච්ඡේදයේ 19(1) (1) වගන්තිය | - | පළාත් පාලන අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා නොගෙන වර්ෂ 2009 සිට 2013 දක්වා කාල පරිච්ඡේදය සඳහා තාවකාලිකව පත්කළ නිලධාරීන් 41 දෙනෙකුට රු.5,428,894 ක් වූ වැටුප් ගෙවා තිබුණි. |
| (ආ) ප්‍රාදේශීය සභා රීති ( මූල්‍ය සහ පරිපාලන) -1989 | | |
| I පරිච්ඡේදයේ 5(xii) වගන්තිය | - | මුදල් සහ ගබඩා භාරකාරිත්වය පවරි තිබූ නිලධාරීන් තිදෙනෙකු ගෙන් ආරක්ෂක ඇප තැන්පතු ලබාගෙන නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

-------------------------------------

මු.රෙ. 571(2)(3) - හඳුනාගැනීමට හෝ ලියා හැරීමට කටයුතු නොකොට, ආදායම් තැන්පතු ගිණුමෙහි වූ රු.156,650 ක් වූ ශේෂය වර්ෂ 16 කට අධික කාලයක් අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

--------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම් අතිරික්තය රු.15,328,480 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එයට අනුරූපව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම් අතිරික්තය රු.4,435,483 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.10,892,997 කින් වර්ධනය වී තිබුණි.

2.2 ආදායම් පරිපාලන

----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳව සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| i. තක්සේරු බදු | 50,003 | 6,445 | 4,413 |
| ii. කුලී | 5,175 | 7,290 | 2,865 |
| iii. සේවා ගාස්තු | 6,023 | 2,167 | 6,928 |
| iv. වරෙන්තු ගාස්තු | 14,260 | 17,169 | 54 |
| v. වෙනත් ආදායම් | 18,749 | 9,105 | 458 |

2.2.2 විදුලි සංදේශ කුළුණු බලපත්‍ර ගාස්තු

ප්‍රාදේශිය සභා පරිපාලන ප්‍රදේශය තුල ස්ථාපිත කරන ලද විදුලි සංදේශ කුළුණු වෙනුවෙන් බලපත්‍ර ගාස්තු අයකිරීමට සභාව අපොහොසත් වී තිබුණු අතර මේ නිසා සභාවට රු.33,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) වර්ෂ 08 කට වැඩි කාලයකට පෙර පරිත්‍යාග ලෙස වෙනත් ආයතනයන්ගෙන් සභාවට ලැබී තිබුණු මෝටර් වාහන 18 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂය සඳහා වූ සමීක්ෂණ මණ්ඩල වාර්තාවෙහි දක්වා තිබූ වට්ටෝරු භාණ්ඩ විෂයයන් 574 ක සහ පුස්තකාල පොත් 1574 ඌණතාවන් සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබුණි.

(ඇ) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ 2001 අගොස්තු 07 සහ අංක 15/2001 දරණ චක්‍රලේඛය සහ 2009 අප්‍රේල් 16 සහ අංක 09/2009 දරන චක්‍රලේඛ මගින් ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව වේලා සටහන් යන්ත්‍ර ස්ථාපිත කිරීමට සභාව අපොහොසත් වී තිබුණි.

(ඇ) 2006 වර්ෂය තුල විවිධ පුද්ගලයන්ගෙන් ලබාගත් එකතුව රු.15,605 ක් වූ උපලබ්ධි නොවූ චෙක්පත් සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබුණි.

4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

---------------------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

--------------------------

පළාත් පාලන අමාත්‍යාංශයේ අංක 03 සහ 2015 නොවැම්බර් 08 දිනැති චක්‍රලේඛයේ 08 ඡේදය ප්‍රකාරව සෑම පළාත් පාලන ආයතනයක් විසින්ම අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවිය යුතු නමුත් සභාව විසින් අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

5. පද්ධති සහ පාලන

------------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සභාවේ විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය

(ඈ) අයවැය පාලනය